# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2010/6 - 2017 මාර්තු මස 14 වැනි අඟහරුවාදා - 2017.03.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය.: 3/6/2016/10

ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය.: 4-3/7/2016/එච්ඩබ්ලිව්/129.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තරය:*

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩපොලමැදලස්ස කෝරළේ සුළු කොට්ඨාසයේ අංක 893, පරබැවිල ග්‍රාම නිලධාරි වසමට අයත් පරබැවිල ගම්වල පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක මූ. පි. අ. කු 2343 දරන සැලැස්මේ පෙන්නුම් කර ඇති පහත විස්තර සඳහන් ඉඩම් කැබලි:

1. **කැබලි අංක 136**

ඉඩමේ නම: කැටකාලගහමුලවත්ත *හෙවත්* දමුණුගහමුලවත්ත; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: දුෂ්මන්ති ලියනගම; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0409.

2. **කැබලි අංක 137**

ඉඩමේ නම: කැටකාලගහමුලවත්ත *හෙවත්* දමුණුගහමුලවත්ත; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: තනුජා ප්‍රියදර්ශනී ලියනගම; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0102.

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2017 මාර්තු මස 29 වැනි දින පෙ. ව. 10.00ට පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2017 මාර්තු 22 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම්/පරවශ්‍යතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

අනෝමා දිසානායක,<br>
ප්‍රාදේශීය ලේකම්,<br>
පොල්ගහවෙල.

2017 පෙබරවාරි මස 28 වැනි දින,<br>
පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

03 - 1164

1A - G 25264 - 17 (2017/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.